# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2442/32 - 2025 ජුනි මස 24 වැනි අඟහරුවාදා - 2025.06.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත ( 460 වැනි පරිච්ඡේදය)**

**7 වැනි වගන්තිය යටතේ දැන්වීම**

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබාගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 243 උප්පුවේලි ග්‍රාම සේවා වසමේ ත්‍රිකුණාමලය ප්‍රාදේශීය සභා සීමාව තුළ සර්වේ ජනරාල් විසින් 2025.01.10 දිනැතිව පිළියෙල කරන ලද සීඑම්260005, දරන පිඹුරේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.4431 පමණ වූ කැබලි අංක 01 ඉඩමට මායිම්:

01. **කැබලි අංක 01**

ප්‍රමාණය: හෙක්. 1.4431.

***උතුර***: එෆ්වීපී 27 සිතියමේ කැබලි අංක 2 න් කොටසක්; ***නැගෙනහිර***: මුහුදු වෙරළ; ***දකුණ***: මුහුදු වෙරළ සහ එෆ්වීපී 27 සිතියමේ කැබලි අංක 2 න් කොටසක්; ***බටහිර*** : එෆ්වීපී 27 සිතියමේ කැබලි අංක 2 න් කොටසක්;

ඉහත සඳහන් ඉඩම/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025.07.30 වැනි දින පෙ.ව. 11.00 ට ප්‍රාදේශීය ලේකම් වන මා සම්මුඛ විය යුතුය.

තවද, 2025.07.07 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම්/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් 2 ක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**එන්.මදිවන්නන්**
ප්‍රාදේශීය ලේකම්,
ත්‍රිකුණාමලය
නගර හා කඩවත්.

2025 ජුනි මස 16 වැනි දින,
ත්‍රිකුණාමලය
නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 06 - 0248